# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1713/15 — 2011 ජූලි 07 වැනි බ්‍රහස්පතින්දා - 2011.07.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ, පළාත් සභාවේ 2011 අංක 09 දරන ඌව පළාත් කර්මාන්ත සංවර්ධන ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ, පළාත් සභාව විසින් 2011 මැයි මස 26 වැනි දින සම්මත කරන ලදුව 2011 ජූනි මස 16 වැනි දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

කේ. ඩී. සිරිසේන,
පළාත් සභා ලේකම්,
ඌව පළාත් සභාව.

2011 ජූනි මස 23 වැනි දින,
බදුල්ල රජ වීදියේ පිහිටි
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

### ඌව පළාතේ 2011 අංක 09 දරන කර්මාන්ත සංවර්ධන ප්‍රඥප්තිය

ඌව පළාත තුළ ක්‍රියාත්මක පේෂකර්මාන්තය, කුඩා කර්මාන්ත, ගෘහ කර්මාන්ත සුළු කර්මාන්ත අධීක්ෂණය, සංවර්ධනය හා ප්‍රවර්ධනය උදෙසාත් ඊට අනුෂංගික කරුණු ක්‍රියාත්මක කිරීමට අදාල විධිවිධාන සැලැස්වීම සඳහාත්, පනවනු ලබන ප්‍රඥප්තියයි. දීර්ඝ නාමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය 2011 අංක 9 දරන ඌව පළාතේ කර්මාන්ත සංවර්ධන හා ප්‍රවර්ධනය සඳහා වූ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, පළාතේ ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබන දින සිට බලාත්මක වන්නේය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

ප්‍රඥප්තියේ අරමුන

2. මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත සඳහන් පරිදි වේ :-

2.1 ඌව පළාතේ පවතින කර්මාන්ත තව දුරටත් සංවර්ධනය කරමින් හා නව කර්මාන්ත ආරම්භ කරමින් ඒවායේ ආර්ථික ප්‍රතිලාභ උපරිම මට්ටමකට ගෙන ඒම සඳහා ඌව පළාත කර්මාන්ත සඳහා ආකර්ෂණීය පළාතක් බවට පත් කිරීම.

2.2 කර්මාන්ත අංශයේ ඵලදායිතාව නංවාලමින් ජාතික ආර්ථිකයට ලබාදෙන දායකත්වය වැඩිකිරීමත්, කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවක මණ්ඩලවල ජීවන තත්ත්වය උසස් කිරීමත් සහිතව පළාතේ රැකියා නියුක්තිය නංවාලීම මගින් දිලිඳුකම පිටුදැකීම උදෙසා කරනු ලබන දායකත්වය වැඩි කිරීම.

2.3 ඌව පළාතට ආවේනික සාම්ප්‍රදායික කර්මාන්ත ආරක්ෂා කිරීමට ප්‍රමුඛත්වය ලබාදෙමින් ක්ෂුද්‍ර කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත අළුතින් ආරම්භ කිරීමට හා කුඩා කර්මාන්ත තව දුරටත් ව්‍යාප්ත කිරීම සඳහා දිරි ගැන්වීම.

2.4 දැනට කුමන මට්ටමක පවත්වාගෙන යනු ලබන හෝ ආරම්භ කර ඇති සියළුම පේෂකර්මාන්ත, කුඩා කර්මාන්ත, ලුහු ඉංජිනේරු කර්මාන්ත, විසිතුරු භාණ්ඩ හා මෘදු සෙල්ලම් භාණ්ඩ, කලාත්මක නිෂ්පාදන කර්මාන්ත හා ගෘහ කර්මාන්ත පළාත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර, ලියාපදිංචිය සඳහා අදාල සහතිකයක් ලබා ගැනීම.

2.5 කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ දැනට ක්‍රියාත්මක වන, වඩු, පේෂකර්ම, ලුහු ඉංජිනේරු, මැටි, කොහු ඉරටු හා වේවැල් ආශ්‍රිත නිෂ්පාදන මධ්‍යස්ථාන සඳහා ප්‍රදේශයේ සුදුසුකම් ලත් තරුණ තරුණියන් වෘත්තිය පුහුණුව සඳහා බඳවා ගැනීම හා ඔවුනට විධිමත් පුහුණුවක් ලබා දෙමින්, වෘත්තිය පුහුණුව ලත් තරුණ තරුණියන් පිරිසක් බිහි කිරීම.

2.6 කාලීන අවශ්‍යතාවයන්ට අනුව ප්‍රදේශයේ වෘත්තීය පුහුණු අවශ්‍යතාවන් හඳුනා ගැනීම හා එකී වෘත්තීය අවශ්‍යතාවයන්ට අනුව නිර්මාණය කරන ලද වෘත්තීය පුහුණු පාඨමාලාවන් සඳහා ප්‍රදේශයේ තරුණ තරුණියන් බඳවා ගැනීම හා විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ඔවුනට විධිමත් පුහුණුවක් ලබා දීම.

කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම

3. මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටු කිරීම සඳහා දැනට පිහිටුවා ඇති කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන මෙහි (මින් මතු දෙපාර්තමේන්තුව වශයෙන් සඳහන් කරනු ලබන) ආයතනයට පහත සඳහන් කාර්යභාරය ඉටු කිරීමට සුදුසු හා යෝග්‍ය නිලධාරින් ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

ඌව පළාත් කර්මාන්ත අධ්‍යක්ෂ හා කාර්ය මණ්ඩලය

3.1 මෙහි මින් මතු අධ්‍යක්ෂ වශයෙන් සඳහන් කරනු ලබන ඌව පළාතේ කර්මාන්ත අධ්‍යක්ෂ, 3 වැනි වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේය. ඔහු/ඇය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පන්තියේ නිලධාරියකු විය යුතු අතර, ඌව පළාත් ගරු ආණ්ඩුකාරවරයා විසින් පත්කරනු ලබන්නේය. ඔහුට සහයවීම සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පංතියේ නිලධාරියෙකු නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙසද, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ නිලධාරියෙකු සහකාර අධ්‍යක්ෂ ලෙස ද ගරු ආණ්ඩුකාරතුමා විසින් පත් කරනු ලබන්නේ ය.

කර්මාන්ත අධ්‍යක්ෂවරයාට සිය බලතල පැවරිය හැකිය.

3.2 මෙම ප්‍රඥප්තිය යටතේ කර්මාන්ත අධ්‍යක්ෂ වෙත පැවරී ඇති බලතල සහ කාර්යයන් හා පවරනු ලැබූ වෙනත් ඕනෑම කාර්යයක් හා බලතල කර්මාන්ත නියෝජ්‍ය අධ්‍යක්ෂ, කර්මාන්ත සහකාර අධ්‍යක්ෂ හෝ වෙනත් නිලධාරීන් වෙත පැවරිය හැක්කේ ය.

3.3 දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පත් කිරීම, ස්ථාන මාරු කිරීම, උසස් කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීම සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන හා ඌව පළාත් ආණ්ඩුකාරවරයා සහ ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සිදුකරන බලතල අදාල වන්නේය.

අමාත්‍යවරයාගේ බලතල.

3.4 මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ පනවනු ලබන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සම්බන්ධව නියෝග නිකුත් කිරීමට අමාත්‍යවරයාට බලය ඇත්තේය.

ලේකම්වරයාගේ බලතල.

3.5 කර්මාන්ත අධ්‍යක්ෂවරයා විසින් කරනු ලැබූ යම් නියමයක් හෝ තීරණයක් පිළිබඳව, අභියාචනයක් කරනු ලැබූ විට මෙම ප්‍රඥප්තිය යටතේ ලේකම් විසින් තම අභිමතය පාවිච්චි කරමින් එම තීරණ

හෝ නියමයන් වෙනස් කිරීම, නීත්‍යානුකූල වන්නේය. එවැනි සෑම අවස්ථාවක දීම ලේකම්වරයාගේ තීරණය අවසාන තීරණය වන්නේය.

4. මෙම දෙපාර්තතමේන්තුවේ කාර්යයන් සහ කර්තව්‍යයන් පහත සඳහන් පරිදි වේ :- පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යය භාරය

(i) කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල කුසලතා පූර්ණ ශ්‍රම සංවර්ධනය,

(ii) ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාන කර්මාන්ත සංවර්ධනය,

(iii) සම්ප්‍රදායික කර්මාන්ත සංවර්ධනය,

(iv) ආසාදිත කර්මාන්ත නැවත නගා සිටුවීම,

(v) කර්මාන්ත සංවර්ධනයට අදාල යටිතල පහසුකම් සංවර්ධනය,

(vi) කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල තාක්ෂණ සංවර්ධනය,

(vii) කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල ආයතනික සංවර්ධනය,

(viii) කර්මාන්ත ක්ෂේත්‍රයට හිතකර පරිදි නීතිරීති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම,

(ix) කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායිතා සංවර්ධනය,

(x) කාර්මික මූල්‍ය පහසුකම් සැපයීම සඳහා මැදිහත් කරු වීම,

(xi) කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල පුහුණු හා පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,

(xii) කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල වෙළඳ පොල සංවර්ධනය,

(xiii) කර්මාන්ත ක්ෂේත්‍රයේ රාජ්‍ය හා පෞද්ගලික සම්බන්ධතා,

(xiv) කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල අපනයන ප්‍රවර්ධනය,

(xv) දෙපාර්තමේන්තුව යටතේ පවත්නා මධ්‍යස්ථාන වර්තමානයට උචිත වන පරිදි හා අරමුණු ඉටු කර ගැනීම පහසු කර ගැනීම සඳහා "මානව හා ආර්ථික සංවර්ධන මධ්‍යස්ථානය" (පේෂ/වඩු/ලුහු/මැටි/කොහු ඉරටු) නමින් හඳුන්වා නිර්මාණාත්මකව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

5. මෙම ප්‍රඥප්තිය යටතේ දෙපාර්තමේන්තුවේ අරමුණ සපුරා ගැනීමට සහ එයට පැවරී ඇති කාර්යය ඉටු කිරීමට අවශ්‍ය වන්නාවූ බලතල ලිඛිත නීතියේ සීමාවන්ට යටත්ව දෙපාර්තමේන්තුව සතුවිය යුතුය. දෙපාර්තමේන්තුව සතු බලතල

6. දෙපාර්තමේන්තුවට වරින් වර ඇති වන අවශ්‍යතාවය අනුව කාර්යය මණ්ඩලය ඉල්ලුම් කිරීමට කර්මාන්ත අධ්‍යක්ෂකට හැකියාව ඇත්තේය. කාර්යය මණ්ඩල

7. පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදේශක මණ්ඩලය- පළාත් කර්මාන්ත උපදේශක මණ්ඩලය

7.1 ඌව පළාතේ කර්මාන්ත සංවර්ධනය පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම සඳහා සාමාජිකයන් 11 දෙනෙකුගෙන් සමන්විත පළාත් කර්මාන්ත උපදේශක මණ්ඩලයක් අමාත්‍යවරයා විසින් තෝරා පත්කළ යුතු වන්නේය

7.2 මෙම උපදේශක මණ්ඩලය පහත සඳහන් පුද්ගලයින්ගෙන් සමන්විත වන්නේය

(i) පළාත් කර්මාන්ත අමාත්‍යංශයේ ලේකම්

(ii) පළාත් කර්මාන්ත අධ්‍යක්ෂ

(iii) ඇමතිතුමා විසින් පත් කරන ලද කර්මාන්ත ක්ෂේත්‍රයට ඇල්මක් දක්වන නියෝජිතයන් දෙදෙනෙක්,

(iv) ජාතික ශිල්ප සභාවේ ඌව පළාතේ සම්බණ්ධිකරණ නිළධාරී,

(v) ඌව පළාත් වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ සභාපති,

(vi) බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කයන්හී රජයේ කාර්මික විද්‍යාලවල තාක්ෂණික උපදේශකවරුන් දෙදෙනෙක්,

(vii) ඌව පළාත් ශිල්ප බලමණ්ඩලයේ සභාපති,

(viii) ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ව්‍යවසායකත්ව ප්‍රවර්ධන අංශයේ කථිකාචාර්‍යවරයෙක්,

(ix) බැංකු නියෝජනය සඳහා ඌව පළාතේ ක්‍රියාත්මක රාජ්‍ය බැංකුවලින් එක් අයෙකු.

7.3 ඌව පළාතේ කර්මාන්ත අමාත්‍යංශයේ ලේකම් නිල බලයෙන් මෙම උපදේශක මණ්ඩලයේ සභාපති වන්නේය

7.4 කර්මාන්ත අධ්‍යක්ෂ නිල බලයෙන් මෙම උපදේශක මණ්ඩලයේ ලේකම් වන්නේය

7.5 සාමාජිකයන්ගේ ධූර කාලය වසර තුනකි

7.6 තනතුරෙන් ඉල්ලා අස්වීමෙන් හෝ මිය යාමෙන් හෝ කාලය අවසන් වීමෙන් හෝ අමාත්‍යවරයා විසින් ධූරයෙන් ඉවත්කරනු ලැබීමෙන් හෝ සාමාජිකයෙකුගේ ධූර කාලය අවසන් වන්නේය

7.7 කාලය ඉකුත්වීම හේතුවෙන් ධූරය හිස්කරනු ලබන සාමාජිකයින් නැවත පත්කිරීමේ හැකියාවක් ඇත්තේය

7.8 සභා රැස්වීමක් සඳහා ගණපූර්ණය හත් දෙනෙකු විය යුතුය

7.9 මෙම උපදේශක මණ්ඩලයට සම්බන්ධව දිස්ත්‍රික් කර්මාන්ත සංවර්ධන කමිටු, ප්‍රාදේශීය කර්මාන්ත සංවර්ධන කමිටු සහ මධ්‍යස්ථාන කර්මාන්ත සංවර්ධන කමිටු පත් කිරීමේ හැකියාව හා ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් ඇත්තේය.

උපදේශක මණ්ඩලයේ කාර්ය භාරය

7.10 එකී උපදේශක මණ්ඩලයේ අදාල විෂය පිළිබඳව ගරු විෂය භාර අමාත්‍ය තුමා වෙත සුදුසු නිරීක්ෂණ, නිර්දේශ හා උපදෙස් ඉදිරිපත් කිරීමත් පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවා වැඩි දියුණු කිරීමත් උපදේශක මණ්ඩලයේ කාර්යභාරය වන්නේය

7.11 උපදේශක මණ්ඩලය මසකට වරක් අවම වශයෙන් රැස්විය යුතුය

පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව උපලේඛනගත ආයතනයක් බව.

8 පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව අල්ලස් පනතේ අර්තානුකුලව උපලේඛන ගත ආයතනයක් වන අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුවම අදාල විය යුතු වන්නේය

නිලධාරීන් සහ සේවකයින් රාජ්‍ය නිලධරයන් බව.

9 පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියළු නිළධාරීන් හා සේවකයින් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකුලව සහ එහි කාර්යන් සඳහා රාජ්‍ය නිළධරයන් ලෙස සලකණු ලැබිය යුත්තේය

## 11 වන කොටස

### *වරදවල් හා දණ්ඩන*

වරදවල්

10 මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ විධිවිධානයක් කඩ කරන හෝ ක්‍රියා කිරීම පැහැරහරින හෝ මෙම ප්‍රඥප්තිය යටතේ යම් අයෙකුට පැවරී ඇති කර්තව්‍යන් ඉටු කිරීම වුවමනාවෙන්ම අවහිර කරන යම් තැනැත්තෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේය

11. මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද රෙගුලාසි යටතේ සිදුවන සියළු වැරදි සම්බන්ධයෙන් සාමාන්‍ය පොදු නීතිය බලපාන අතර ඒ අනුව පොදු නීතියේ විධිවිධානයන් යටතේ එකී වරද සම්බන්ධයෙන් නියම කරනු ලබන දඬුවම් අදාල වන්නේය. — දඬුවම්

111 කොටස

*පොදු විධිවිධාන*

දෙපාර්තමේන්තුවේ වත්කම්

12. (1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා පළාත තුළ යොදවාගෙන තිබූ සියළුම ආයතන සතුව පැවති වත්කම් හා දේපළ මෙම ප්‍රඥප්තිය යටතේ පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබූ වත්කම් හා දේපළ වශයෙන් සැලකිය යුත්තේය

(2) පහත (3) වගන්තිය යටතේ හැර පුහුණු අලෙවි හා සේවා මධ්‍යස්ථාන වල ගොඩනැගිලි හා භූමිය වෙනත් කටයුතු සඳහා යොදා නොගත යුතුය

(3) පොදු වැදගත්කමකින් යුත් වෙනත් කාර්යයන් සඳහා මෙම ආයතන යොදා ගැනීමට අවශ්‍ය වූ විටකදී කර්මාන්ත අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය සහිතව ලේකම් වරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වන්නේය. — ආයතන වෙනත් පොදු කටයුතු වලට යොදා ගැනීම.

13. (1) ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලැබූ ආයතන වල නඩත්තුව උදෙසා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම හා වැයකිරීම සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන අයත් වන්නේය — දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වයට අවශ්‍ය මූල්‍ය ආධාර

(2) පළාත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන රාජකාරි ඉටුකිරීමට අවශ්‍ය වන ප්‍රාග්ධන හා පුනරාවර්තන ප්‍රතිපාදන පළාත් සභා වාර්ෂික අයවැයෙන් සලසනු ඇත.

(3) අදාල විෂයයන් පළාත තුළ සංවිධානය කිරීම සඳහා රේඛිය අමාත්‍යාංශ සහයෝගිත්වයෙන් මධ්‍යකාලීන අරමුදල් ප්‍රතිපාදන සපයා ගත යුතුය.

(4) දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව සංවිධානය කරන ප්‍රදර්ශන, සල්පිල්, වෙළඳපල වැනි ක්‍රියාකාරකම් මගින් උපයා ගත හැකි ආදායම් පළාත කර්මාන්ත අධ්‍යක්ෂ ගිණුමට බැර කෙරෙනු ඇත.

(5) ග්‍රාමීය කර්මාන්ත කරුවන්ගේ ජීවන රටාව වැඩි දියුණු කිරීමෙහි ලා උත්සුක වන දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන වල ප්‍රතිපාදන අදාල ක්ෂේත්‍රයන් සඳහා ලබා ගැනීමට කටයුතු කරනු ඇත.

(6) දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන හරහා හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ද්‍රව්‍යමය ආධාර ලබා ගැනීමට දෙපාර්තමේන්තු උත්සුක වනු ඇත.

(7) ලිඛිත විධිවිධානයන්ට යටත්ව දෙපාර්තමේන්තුවේ කටයුතු උදෙසා දේශීය විදේශීය ප්‍රභවයන්ගෙන් මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ලබා ගැනීමට බාධාවක් නොතිබිය යුතුය

14 මුදල් වර්ෂය ලිත් වර්ෂය වේ. ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා — මුදල් වර්ෂය

15. වර්ෂය තුළදී පළාත තුළ කර්මාන්ත සංවර්ධන කටයුතු පවත්වා ගන්නා ලද ආකාරය, පැන නැගුන ගැටළු, ඒවා විසඳීමට ගත් පියවර ගැන සඳහන් කෙරෙන වාර්ෂික පාලන වාර්තාවක් එක් එක් වර්ෂය ඉකුත්ව මාස දෙකක කාලයක් ඉකුත්වීමට පෙර අධ්‍යක්ෂවරයා විසින් පළාත් කර්මාන්ත ලේකම්ගේ නිර්දේශය සහිතව අමාත්‍ය වරයාට ඉදිරිපත් කළ යුතුය — පාලන වාර්තා

16. දෙපාර්තමේන්තුවේ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් දෙපාර්තමේන්තුවට විශේෂ හෝ සාමාන්‍ය හෝ විධාන ලිඛිතව දෙනු ලැබිය හැකි අතර, දෙපාර්තමේන්තුව විසින් එම විධානයන් ක්‍රියාත්මක කළ යුතු වන්නේය — විධාන නිකුත් කිරීමට අමාත්‍යවරයාට ඇති බලතල

නියෝග පැනවීමට අමාත්‍යවරයාට ඇති බලතල

17. (1) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකල දිනයේ සිට හෝ එහි සඳහන් ඊට පසු දිනක සිට හෝ ක්‍රියාත්මක වන්නේය.

(2) *ගැසට් පත්‍රයේ* පළකිරීමෙන් පසු අනුමැතිය සඳහා එම නියෝග හැකි ඉක්මනින් පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු අතර, එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක් එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව එය අනුමත කරනු නොලැබූ දිනයේ සිට පරිච්ඡින්න කරනු ලැබූ සේ සැලකිය යුතුය.

(3) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබිය යුතුය.

විගණනය

18. 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 වැනි වගන්තියේ සඳහන්ව ඇති විධිවිධාන වලට අනුකූලව සිදු කරනු ඇත.

අර්ථ නිරූපණය.

19. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියේ -

"අමාත්‍යවරයා" යන්නෙන් ඌව පළාතේ කර්මාන්ත හා පේෂකර්මාන්ත විෂයභාර අමාත්‍යවරයා ද,

"අමාත්‍යංශ ලේකම්" යන්නෙන් ඌව පළාතේ කර්මාන්ත හා පේෂකර්මාන්ත අමාත්‍යංශයේ විෂයභාර ලේකම් ද,

"අධ්‍යක්ෂ" යන්නෙන් ඌව පළාතේ කර්මාන්ත හා පේෂකර්මාන්ත විෂයභාර අධ්‍යක්ෂ ද,

"නියොජ්‍ය අධ්‍යක්ෂ" යන්නෙන් ඌව පළාතේ කර්මාන්ත හා පේෂකර්මාන්ත විෂයභාර නියෝජ්‍ය අධ්‍යක්ෂ ද

"සහකාර අධ්‍යක්ෂ" යන්නෙන් ඌව පළාතේ කර්මාන්ත හා පේෂකර්මාන්ත විෂයභාර සහකාර අධ්‍යක්ෂ ද වන්නේය.

20. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ වචනාර්ථ අතර, හෝ පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල වචනාර්ථය හා පාඨාර්ථය බලපැවැත්විය යුතුය.

07-539

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.